සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

27-02-2024

Learning Resource Centre
De Mazenod College
Kandana
28203

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
# ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
# Year End Evaluation - 2023 (2024)

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................................

අත්කම් නිර්මාණය කිරීම පිළිබඳ පුහුණුවක් ලබා ඇති සමිතු පෙරේරා වේවැල්, කෙසෙල් පට්ටා ආශ්‍රිත ස්වභාවික අමුද්‍රව්‍ය යොදා ගෙන විවිධ හැඩයේ කලාත්මක හා ගුණාත්මක අත්බෑග් නිෂ්පාදනය කර තම නිවස ආසන්නයේ ඇති නගරයේ වෙළඳසැල් කිහිපයකට ඉදිරිපත් කළේය. ඉතා කෙටි කාලයකින් තම නිෂ්පාදන සඳහා හොඳ ඉල්ලුමක් පැවති අතර, එම ඉල්ලුම තනිවම සපුරාලීමට නොහැකිවීම නිසා පුහුණු සේවිකාවන් දෙදෙනෙකු තම ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී.

- **ඉහත ඡේදය කියවා අංක 01 සිට 04 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. සමිතු පෙරේරාගේ ව්‍යාපාරය,
    1. වෙළඳ ව්‍යාපාරයකි.
    2. සේවා සපයන ව්‍යාපාරයකි.
    3. මහා පරිමාණ ව්‍යාපාරයකි.
    4. නිෂ්පාදන ව්‍යාපාරයකි.

02. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් වන්නේ,
    1. නිවස නගරය ආසන්නයේ පිහිටා තිබීම
    2. අත්කම් නිර්මාණය පිළිබඳ පුහුණුවක් ලබා තිබීම.
    3. අපතේ යන ද්‍රව්‍ය භාවිතයට ගැනීම
    4. නිෂ්පාදන සඳහා හොඳ ඉල්ලුමක් පැවතීම.

03. සමිතු පෙරේරාගේ ව්‍යාපාරයේ ඇති ලක්ෂණයක් නොවන්නේ,
    1. අඛණ්ඩව පැවැත්මක් තිබීම
    2. ලියාපදිංචිය අනිවාර්යය නොවීම
    3. අලාභය තනිවම භුක්ති විඳීම
    4. බලපාන නීතිරීති අඩුවීම.

04. මෙම ව්‍යාපාරයේ වේවැල් කෙසෙල් පට්ටා යොදා ගෙන විවිධ හැඩයේ කලාත්මක හා ගුණාත්මක බෑග් නිෂ්පාදනය කිරීම කුමන නිෂ්පාදන සාධකයට අයත් වන්නේ ද?
    1. භූමිය
    2. ශ්‍රමය
    3. ප්‍රාග්ධනය
    4. ව්‍යවසාය

05. ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයක් ලෙස අයිතිකරුවන්ගේ අරමුණක් නොවන්නේ,
    1. ආයෝජනයේ සුරක්ෂිතතාවය
    2. රැකියා වර්ධනය හා රැකියා තෘප්තිය
    3. ප්‍රමාණවත් ලාභයක් ලැබීම
    4. ව්‍යාපාරයේ අනාගත වර්ධනය

06. බාහිර පරිසර සාධක අයත් කාණ්ඩය තෝරන්න.
    1. අයිතිකරුවන්, සේවකයින්, කළමනාකරුවන්
    2. සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන්, සේවකයින්
    3. අයිතිකරුවන්, ගනුදෙනුකරුවන්, සේවකයින්
    4. තරගකරුවන්, සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන්

07. පහත වගුවේ x තීරුවේ ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන්ද y තීරුවේ ඔවුන් ව්‍යාපාරවලට දක්වන දායකත්වය ද දක්වේ.

| x | y |
|---|---|
| 1. අයිතිකරුවෝ | A - නිවැරදි තීරණ ගැනීම |
| 2. කළමනාකරුවෝ | B - ශ්‍රම ඵලදායිතාවය වැඩි කිරීම |
| 3. සේවකයෝ | C - ව්‍යාපාර කටයුතු සුපරීක්ෂණය |
| 4. සැපයුම්කරුවෝ | D - කලට වේලාවට අමුද්‍රව්‍ය සැපයීම |

ඉහත x තීරුවේ ඇල්මැති පාර්ශ්ව සමඟ y තීරුවේ දායකත්වයන් නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.
    1. 1C, 2A, 3B, 4D
    2. 1C, 2D, 3B, 4A
    3. 1D, 2B, 3C, 4A
    4. 1A, 2B, 3C, 4D

08. පහත සඳහන් ප්‍රකාශන අතරින් නිවැරදි ප්‍රකාශනය තෝරන්න.
1. රජය ව්‍යාපාර කෙරෙහි නීතිරීති පැනවීමෙන් පාරිභෝගිකයින් ආරක්ෂා වේ.
2. පොලී අනුපාත වැඩි කිරීම නිසා ව්‍යාපාරිකයින් ණය ලබා ගැනීමට වැඩිපුර පෙලඹේ.
3. මිල මට්ටම් ඉහල යාම නිසා පාරිභෝගිකයින්ට මිලදී ගැනීමේ හැකියාව වැඩිවේ.
4. වැටුප්, ආදායම්, ඉතිරිකිරීම්, ආයෝජන, දේශපාලන පරිසරයට අයත් සාධකයන්ය.

09. ආර්ථික පරිසරයට අයත් සාධක වන්නේ,
1. පොලී අනුපාතය, නීතිරීති, ඉතුරුම්, රැකියා නියුක්තිය
2. ඉතුරුම්, ජාත්‍යන්තර සබඳතා, යටිතල පහසුකම්, උද්ධමනය
3. ආදායම් ව්‍යාප්තිය, විදේශ විනිමය අනුපාත, රැකියා නියුක්තිය, අයවැය ප්‍රතිපත්ති
4. උද්ධමනය, මිලමට්ටම, විදේශ විනිමය අනුපාතය, ආදායම් ව්‍යාප්තිය

10. ව්‍යාපාර පරිසරය සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.
A - කළමනාකරුවන්ගේ අත්දැකීම්
B - සේවකයින්ගේ අයහපත් ආකල්ප
C - ව්‍යාපාර සඳහා බදු සහන ලබාදීම
D - තරඟකරුවන් බිහිවීම.
- ඉහත කරුණු සම්බන්ධව වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

1. B ව්‍යාපාරයට ශක්තියක් වන අතර, C ව්‍යාපාරයට අවස්ථාවකි.
2. C ව්‍යාපාරයට අවස්ථාවක් වන අතර D ව්‍යාපාරයට දුර්වලතාවයකි.
3. A ව්‍යාපාරයට අවස්ථාවක් වන අතර, D ව්‍යාපාරයට තර්ජනයකි.
4. A ව්‍යාපාරයට ශක්තියක් වන අතර, B ව්‍යාපාරයට දුර්වලතාවයකි.

11. පෞද්ගලික අංශය සතු ලාභ අරමුණ නොවූ ව්‍යාපාර සංවිධාන යුගලය ඇතුළත් පිළිතුර වන්නේ,
1. හවුල් ව්‍යාපාර හා සමිති සංවිධාන යි
2. තනි පුද්ගල ව්‍යාපාර හා සමුපකාර ව්‍යාපාර යි
3. සමුපකාර ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර යි
4. සමිති සංවිධාන හා සමුපකාර ව්‍යාපාර යි

12. ව්‍යාපාර සංවිධාන කෙරෙහි බලපාන අණ පනත් කිහිපයක් පහත දැක්වේ.
A - 2007 අංක 07 දරණ සමාගම් පනත
B - 1972 අංක 05 දරණ සමුපකාර සමිති පනත
C - 1840 වංචා වැළැක්වීමේ ආඥා පනත
D - 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත
- ඉහත අන පනත් අතරින් හවුල් ව්‍යාපාර වලට පමණක් බලපාන පනත් අඩංගු පිළිතුර වනුයේ,

1. AB හා C ය. 2. AB හා D ය. 3. AC හා D ය. 4. BC හා D ය.

13. සංස්ථාපිත සමාගම්, රාජ්‍ය සංස්ථා හා රාජ්‍ය දෙපාර්තමේන්තු යන ව්‍යාපාර සංවිධාන තුනටම පොදු ලක්ෂණය මින් කුමක් ද?
1. නෛතික පුද්ගලභාවය
2. වගකීම් සීමාසහිත වීම
3. අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් පාලනය කිරීම
4. අඛණ්ඩ පැවැත්ම

14. පෞද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකෙහිම ක්‍රියාත්මක වන ව්‍යාපාර සංවිධාන වර්ගය තෝරන්න.
1. සමිති සංවිධාන 2. දෙපාර්තමේන්තු 3. සමුපකාර ව්‍යාපාර 4. සංස්ථාපිත සමාගම්

15. ව්‍යාපාරයක ප්‍රාග්ධන ප්‍රමාණය, සේවක සංඛ්‍යාව, වෙළඳපොළ කොටස, භාවිතා කරන බලශක්ති ප්‍රමාණය යන සාධක යොදා ගන්නේ,
1. අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දීය.
2. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දීය.
3. හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දීය.
4. පිහිටීම අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දීය.

16. ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීමෙන් ව්‍යාපාරයට,
1. නීතිමය පුද්ගලභාවයක් හිමිවේ.
2. අනන්‍යතාවයක් ලැබේ.
3. ගැටළු පැන නැගීම සීමාවේ.
4. අඛණ්ඩ පැවැත්ම තහවුරු වේ.

17. ව්‍යාපාරයන් හා වෙනත් පාර්ශ්ව අතර සිදුවන සම්පත් හුවමාරුවීම ගිණුම්කරණයේ දී හඳුන්වන්නේ,

1. සිද්ධියක් ලෙසය.
2. තොරතුරක් ලෙසය
3. ගනුදෙනුවක් ලෙසය
4. වත්කම් ලෙසය.

18. ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු සහ සිදුවීම් කිහිපයක් පහත දක්වේ.

A - අයිතිකරු රුː 50000ක අතිරේක ප්‍රාග්ධනයක් යෙදවීම.

B - රුː 50000 ක වැටුපකට සේවකයෙකු බඳවා ගැනීම.

C - රුː 100000ක බැංකු ණයක් ගැනීම

D - රුː 12000ක බඩු තොගයක් ගින්නෙන් විනාශවීම.

- ඉහත ගනුදෙනු සහ සිදුවීම් අතුරෙන් ගිණුම්කරණයේදී සැලකිල්ලට ගනු ලබන්නේ,

1. A, B හා C ය.
2. A, C හා D ය.
3. B, C හා D ය.
4. A, B හා D ය.

19. අතීත ගනුදෙනුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන, ව්‍යාපාරය විසින් බාහිර පාර්ශ්වයන්ට ගෙවිය යුතු අගය හඳුන්වන්නේ,

1. ආදායම් ලෙසය.
2. වියදම් ලෙසය.
3. වත්කම් ලෙසය.
4. වගකීම් ලෙසය.

20. ව්‍යාපාරයක හිමිකම අඩුවීමට බලපාන ගනුදෙනුවක් වන්නේ,

1. රුː 50,000 ක යන්ත්‍රයක් අත්පිට මුදලට ගැනීමය.
2. රුː 10,000ක් ණයගැතියන්ගෙන් ලැබීමය.
3. රුː 5,000ක බැංකුණය පොලී මුදලින් ගෙවීමය.
4. රුː 30,000ක භාණ්ඩ තොගයක් ණයට ගැනීමය.

21. කුමාරගේ ව්‍යාපාරයේ 2023. 01. 01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත දක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| වත්කම් | = | හිමිකම | + | වගකීම් |
| රුː 200,000 | = | රුː 150,000 | + | රුː 50,000 |

2023. 01. 05 දින සිදු වූ ගනුදෙනුවකින් පසු ගිණුම්කරණ සමීකරණයේ වත්කම් හා වගකීම් රුː 10,000 කින් වැඩිවිය. එම ගණුදෙනුව විය හැක්කේ,

1. රුː 10,000ක් ණයගැතියන්ගෙන් ලැබීමය.
2. රුː 10,000ක භාණ්ඩ අත්පිට මුදලට ගැනීමය.
3. රුː 10,000ක බැංකු ණය ආපසු ගෙවීමය.
4. රුː 10,000ක භාණ්ඩ තොගයක් ණයට ගැනීමය.

22. රුː 25,000ක් ණය හිමියන්ට ගෙවීමට අදාල ගනුදෙනුවේ ද්විත්ව බලපෑම වන්නේ,

1. වත්කමක් වැඩිවී වගකීමක් වැඩිවීමය.
2. වත්කමක් අඩුවී හිමිකම අඩුවීමය.
3. වත්කමක් අඩුවී වගකීමක් අඩුවීමය.
4. වත්කමක් වැඩිවී හිමිකම වැඩිවීමය.

23. නිමි ඇඳුම් මසා අලෙවිකරන ව්‍යාපාරයක් පවත්වාගෙන යන වාසනා විසින් ශක්ති සමාගමෙන් රුː 500,000ක් වටිනා ඇඳුම් මැසීමේ යන්ත්‍රයක් ණයට ලබා ගනියි. මෙම ගනුදෙනුවට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

1. ගැනුම් ගිණුම හර 500 000
   මුදල් ගිණුම බැර 500 000
2. ගැනුම් ගිණුම හර 500 000
   ශක්ති සමාගම ගිණුම බැර 500 000
3. යන්ත්‍ර ගිණුම හර 500 000
   මුදල් ගිණුම බැර 500 000
4. යන්ත්‍ර ගිණුම හර 500 000
   ශක්ති සමාගම ගිණුම බැර 500 000

24. ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනුවකට අදාල ද්විත්ව සටහනක් පහත දක්වේ.

| | | |
|---|---|---|
| මෝටර් රථ ගිණුම හර | 800 000 | |
| ප්‍රාග්ධන ගිණුම බැර | | 800 000 |

ඉහත ද්විත්ව සටහනට අදාළ ගනුදෙනුව වන්නේ,

1. රුː 800 000 වටිනා මෝටර් රථයක් ව්‍යාපාරයට මිලදී ගැනීමය.
2. රුː 800 000 වටිනා මෝටර් රථය අයිතිකරු ව්‍යාපාරයට යෙදවීමය.
3. රුː 800 000 වටිනා මෝටර් රථය ණයට ගැනීමය.
4. රුː 800 000 වටිනා මෝටර් රථයක් අයිතිකරු ව්‍යාපාරයෙන් ලබා ගැනීමය.

25. පහත සඳහන් x තීරුවේ ගිණුම් වර්ගද, y තීරුවේ ගිණුම් කීපයක් සඳහා නිදසුන් ද දැක්වේ.

| x | y |
|---|---|
| 1. වත්කම් ගිණුම් | A - සේවක වැටුප් ගිණුම |
| 2. වියදම් ගිණුම් | B - බැංකු ණය ගිණුම |
| 3. හිමිකම් ගිණුම් | C - ගැතිලි ගිණුම |
| 4. ආදායම් ගිණුම් | D - විකුණුම් ගිණුම |
| 5. වගකීම් ගිණුම් | E - උපකරණ ගිණුම |

ඉහත x තීරුවේ ගිණුම් වර්ග y තීරුවේ ලෙජර් ගිණුම් සමග ගැලපූ විට අනුපිළිවෙල දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

1. A, B, C, D හා E ය. 2. A, C, B, D හා E ය. 3. E, B, C, D හා A ය. 4. E, A, C, D හා B ය.

- පහත තොරතුරු ඇසුරින් අංක 26 - 28 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු කීපයක් පහත දක්වේ.

A - අත්පිට විකුණුම් රු: 12,000
B - ණයට විකුණුම් රු: 9,000
C - විදුලි ගාස්තු මුදලින් ගෙවීම් රු: 2,000
D - කාර්යාලයට ලී බඩු උපකරණ ණයට ගැනීම් රු: 50,000

26. ලදුපත මූලාශ්‍ර ලේඛනය ලෙස භාවිතා කරන ගනුදෙනුව වන්නේ,

1. A ය 2. B ය 3. C ය 4. D ය

27. ගෙවීම් වවුචරය මූලාශ්‍ර ලේඛනය ලෙස යොදා ගන්නා ගනුදෙනුව වන්නේ,

1. A ය 2. B ය 3. C ය 4. D ය

28. පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනුව වන්නේ,

1. A ය 2. B ය 3. C ය 4. D ය

29. ව්‍යාපාරයක මුදල් වට්ටම් ඇතිවන්නේ,

1. භාණ්ඩ ණයට විකිණීමේදී ය. 2. භාණ්ඩ ණයට මිලදී ගැනීමේදී ය.
3. භාණ්ඩ අත්පිට මුදලට විකිණීමේදී ය. 4. නියමිත කාලය තුළ, ණය බේරුම් කිරීමේදී ය.

- පහත දක්වෙන තොරතුරු ඇසුරින් අංක 30 - 31 සඳහා පිළිතුරු සපයන්න.

සමන්තගේ ව්‍යාපාරයේ 2023. 01. 31 දිනට පැවති සුළු මුදල් ශේෂය රු: 1200කි. ජනවාරි මාසයේ වියදම් කළ මුදල රු: 1800කි.

30. සමන්ත ගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය කොපමණ ද?

1. රු: 1200 කි. 2. රු: 1800 කි. 3. රු: 3000 කි. 4. රු: 3800 කි.

31. පෙබරවාරි මාසයේ සිට අග්‍රිමය රු: 1000කින් අඩුකිරීමට තීරණය කළේ නම් 2023. 02. 01 දිනට ප්‍රතිපූරණය කළයුතු මුදල කොපමණද?

1. රු: 600කි. 2. රු: 800 කි. 3. රු: 3000කි. 4. රු: 3800කි.

32. ව්‍යාපාරයක රු: 3000ක විදුලි ගාස්තු චෙක්පතකින් ගෙවීම සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත පිළිවෙළින් දක්වෙන පිළිතුර වන්නේ,

1. ලදුපත, බැංකු ගිණුම ය 2. ලදුපත, මුදල්පොත ය
3. ගෙවීම් වවුචරය, මුදල් පොත ය 4. ගෙවීම් වවුචරය, බැංකු ගිණුම ය

33. ව්‍යාපාරයක් පවත්වාගෙන යන බැංකු ගිණුම පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. මූලික සටහන් පොතක කාර්යය සහ ලෙජර් ගිණුමක කාර්යය ඉටුකරයි.
2. වාසිදායක ශේෂය හර ශේෂයකි.
3. බැංකු ගිණුම වගකීම් ගිණුමකි.
4. චෙක්පත් හා මුදල් තැන්පත් කිරීම හරට සටහන් කරයි.

24.02.2024
ශ්‍රේ- 10

28249

34. නන්දනගේ ව්‍යාපාරයේ ණයගැතියෙකුගෙන් ලැබී බැංකුවේ තැන්පත් කරන ලද රුः 10,000ක චෙක්පත අගරු වී ඇත. චෙක්පත් අගරු වීමට අදාල ද්විත්ව සටහන දැක්වෙන පිළිතුර තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. බැංකු ගිණුම හර | 10 000 | | 2. මුදල් ගිණුම හර | 10 000 | |
| ණයගැති ගිණුම බැර | | 10 000 | ණයගැති ගිණුම බැර | | 10 000 |
| 3. ණයගැති ගිණුම හර | 10 000 | | 4. ණයගැති ගිණුම හර | 10 000 | |
| මුදල් ගිණුම බැර | | 10 000 | බැංකු ගිණුම බැර | | 10 000 |

35. ගගනගේ ව්‍යාපාරයේ 2023. 12. 31 දින බැංකු ගිණුමේ ශේෂය රුः 10,500ක් වූ අතර, එදිනම බැංකුවෙන් එවන ලද බැංකු ප්‍රකාශයේ ශේෂය රුः 7500ක් විය. මෙම ශේෂයන්ගේ වෙනසට බලපෑ ගනුදෙනුව කුමක් ද?

1. ණයගැති ප්‍රේෂණ රුः 3000ක මුදල
2. බැංකුව රැස්කරගත් ආයෝජන ආදායම් රුः 3000ක මුදල
3. නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ රුः 3000ක චෙක්පත
4. බැංකුව විසින් අයකරගත් රුः 3000ක බැංකු ගාස්තු

36. පහත සඳහන් පරිගණක මෘදුකාංග අතුරින් ගිණුම්කරණ පරිගණක මෘදුකාංගය දැක්වෙන පිළිතුර තෝරන්න.

1. Ms word    2. Excel    3. Sage    4. Access

37. ගැනුම් ජ'නලයේ සටහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

1. ගැනුම් ගිණුම් හර
   ණයගැති ගිණුම බැර
2. ගැනුම් ගිණුම් හර
   ණයහිමි ගිණුම බැර
3. ණයගැති ගිණුම හර
   ගැනුම් ගිණුම බැර
4. ණයහිමි ගිණුම හර
   ගැනුම් ගිණුම බැර

38. පහත සඳහන් ගනුදෙනු අතරින් පොදු ජ'නලයේ සටහන් නොකරන ගනුදෙනුව වන්නේ,

1. අයිතිකරු රුः 500,000 ක් වටිනා මෝටර් රථය ව්‍යාපාරයට යෙදවීම.
2. ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ලංකා සමාගමෙන් රුः 100,000 ක උපකරණ ණයට ගැනීම.
3. අයිතිකරු ව්‍යාපාරයෙන් රුः 15,000ක් වටිනා භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.
4. අයිතිකරු රුः 10,000ක මුදලක් තම පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.

39. ශේෂ පිරික්සුම යනු,

1. ලෙජරයේ ගිණුමකි.
2. ගිණුම්වල ශේෂ ඇතුළත් ලේඛනයකි.
3. මූලාශ්‍ර ලේඛනයකි.
4. මූලික සටහන් පොතකි.

40. ශේෂ පිරික්සුමක බැර තීරුවට සටහන් වන ශේෂ ඇතුළත් ගිණුම් යුගලය දැක්වෙන පිළිතුර කුමක් ද?

1. විකුණුම් ගිණුම සහ ණයගැති ගිණුම
2. ණයහිමි ගිණුම සහ උපකරණ ගිණුම
3. ප්‍රාග්ධන ගිණුම සහ ගැනුම් ගිණුම
4. ප්‍රාග්ධන ගිණුම සහ ණයහිමි ගිණුම

Learning Resource Center
R
De Mazenod College
Kandana